# ඇඹිලිපිටිය නගර සභාව
# රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂය මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ඇඹිලිපිටිය නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ දී මහජන බැංකුව ඇඹිලිපිටිය ශාඛාවේ ආරම්භ කර ඇති අංක 045-1-001-5-00410-38 දරන නාගරික සංවර්ධන අධිකාරි ගිණුමෙහි 2012 දෙසැම්බර් 31 දිනට රු. 1,052,331 ක ශේෂය ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සභාවේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 3,237,400 ක් වන අතර, රු. 600,000 ක් පමණක් ලෙජර් ගිණුම් වලට ගලපා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 2,637,400 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 4,078,550 ක් වන අතර, සභාවේ වාර්තා අනුව ලැබිය යුතු ප්‍රමාණය රු. 4,668,570 ක් වූයෙන් එදිනට ණයගැති ප්‍රමාණය රු. 590,020 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 41,610,009 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,165,585 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,192,806 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 ' | රු. 000 ' | රු. 000 ' |
| (i) වරිපනම් හා බදු | 5,529 | 4,474 | 1,055 |
| (ii) බදු කුලී | 7,450 | 5,163 | 2,287 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,961 | 1,635 | 1,326 |
| (iv) වෙනත් ආදායම් | 3,822 | 2,701 | 1,121 |

### 2.2.2 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව හිඟව ඇති රු. 1,259,334 ක බස් නැවතුම්පල ගාස්තු ප්‍රමාණයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රචාරක දැන්වීම් හා පුවරු ගාස්තු ආදායම රු 1,000,000 ක් වන අතර, 2012 තථ්‍ය ලැබීම් රු. 491,402 ක් වේ. ඒ අනුව හිඟ ගාස්තු විධිමත් පරිදි අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රසිද්ධ සිනමා ශාලා දෙකකින් අය කර ගත යුතු විනෝද බදු මුදල් නියමිත පරිදි අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.3. උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් නිලධාරින්ගේ 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 3,237,400 |
| මුද්දර ගාස්තු | 4,668,570 |

2.3 නිශ්ක්‍රීය සම්පත්

රු. 130,066 ක් වැයකර 2010 වර්ෂයේ දී මිලදී ගත් ඇඟිලි සලකුණු වේලා සටහන් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ දෝෂයක් හේතුවෙන් භාවිතායෙන් ඉවත් කර තිබුණි.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.4.1 කිරලවැල් කටුව පරණ පාර තාර යොදා වැඩි දියුණු කිරීමේ කර්මාන්තය

කර්මාන්තය සඳහා 2012 ජූලි 05 දින ගොවි සංවිධානයක් සමග රු. 964,924 ක වටිනාකමින් යුත් ගිවිසුමකට එළඹ තිබූ අතර, ඉදි කිරීම් 2012 අගෝස්තු 29 දින නිමකර තිබූ අතර, ඉටු කල වැඩ වටිනාකම රු. 964,804 ක් විය. 2013 අගෝස්තු 06 දින කරන ලද ස්ථාන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) කාර්මික නිලධාරිගේ 2013 අගෝස්තු 30 දින අවසන් ගෙවීම් වාර්තාව අනුව මීටර් 318 ක් වැඩි දියුණු කල බවට ගෙවීම් නිර්දේශ කර තිබූ නමුත් භෞතික පරික්ෂාවේදී මාර්ගයේ ඉටු නොකරන ලද මීටර් 18 සඳහා රු. 54,611 ක් ගෙවා තිබුණි.

(ii) වියදම් ඇස්තමේන්තු විෂයය අංක 10 සඳහා රු. 68,006 ක් ගෙවා තිබුණද එම විෂයය ඇස්තමේන්තුගත පරිදි ඉටු කර නොතිබුණි.

2.4.2 මහවැලි ක්‍රීඩාංගනයට පිවිසෙන මාර්ගය තාර යොදා වැඩි දියුණු කිරිම

කර්මාන්තය සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ 2012 සැප්තැම්බර් 28 දින රු. 279,260 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2013 ජනවාරි මාසයේදි කල වැඩ වටිනාකම සඳහා රු. 265,425 ක් ගෙවා තිබුණි.

ඇස්තමේන්තුවේ විෂයය අංක 01 සහ 02 ප්‍රකාරව මි. මී. 100 ගල් සපයා ඇතිරීම සඳහා ඝන මීටර් 5.27 ක් සඳහා රු. 14,470 ක් ගෙවා තිබුණද එම කාර්යය ඉටුකර නොතිබූ බව 2013 අගෝස්තු 06 දින කරන ලද භෞතික පරික්ෂාවේ දි අනාවරණය විම.

2.5 මෙහෙයුම් අකර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලබා දී වසර 1 මාස 6 සිට වසර 5 මාස 10 දක්වා කාලයක් ගත වූ එකතුව රු. 949,128 ක් වූ අත්තිකාරම් ප්‍රමාණයක් විගණන දිනය වු 2013 ජූලි 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දී මුදල් පොත අනුව සැප්තැම්බර් මස අවම ශේෂය රු. 1,643,033 ක් වන අතර, උපරිම ශේෂය ජනවාරි මස රු. 5,059,233 ක් ද, 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,454,853 ක් වන බැවින් අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සභා අරමුදලට යම් පොලි ආදායමක් ලබා ගැනීම පිළිබඳව කටයුතු කර නොතිබුණි.

2.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

---------------------------------------------

නිපදවා තිබු කි.ග්‍රෑ. 25 කොම්පෝස්ට් පොහොර මළු 25 ක් සහ කි.ග්‍රෑ. 10 කොම්පෝස්ට් පොහොර මළු 10 ක් සභා භූමියේ අහුරා තිබූ අතර, ඝන අඩි 915 ක පමණ කොම්පෝස්ට් පොහොර තොගයක් ව්‍යාපෘති භූමියේ ඇති ගබඩා කාමරයේ ගොඩගසා තිබුණි. එසේම කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් කිසිඳු ආදායමක් පරික්ෂණ දිනය දක්වා සභා අරමුදලට ලැබී නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ඝණ අපද්‍රව්‍ය කලමනාකරණය